# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2396/54 – 2024 අගෝස්තු මස 09 වැනි සිකුරාදා – 2024.08.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 5/83 III

**1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනත**

1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 26 වන වගන්තිය යටතේ කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

**මහින්ද අමරවීර (පා.ම.),**
කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍ය.

2024 ක් වූ ජූලි මස 31 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2010 මැයි මස 25 වන දින අංක 1655/7 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළකරන ලද 2010 අංක 01 දරන පළිබෝධනාශක (පළිබෝධ පාලන සේවා) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(1) එහි 3 වන නියෝගය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"3. පළිබෝධ පාලන කටයුතු කරගෙන යෑමේ බලපත්‍රයක් සඳහා වන සෑම ඉල්ලුම්පත්‍රයක් ම නියමිත ආකෘතියකින් විය යුතු අතර රුපියල් විසිපන්දහසක ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතු ය."

(2) එහි 5 වන නියෝගයේ (අ) ඡේදය වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"(අ) පවතින බලපත්‍රය ඉකුත්වීමට මාස තුනකට පෙරාතුව රුපියල් දස දහසක අලුත් කිරීමේ ගාස්තුවක් සමග තත්කාර්යය සඳහා නිශ්චිත ඉල්ලුම් ආකෘතියක් මත ඉල්ලුම්පත්‍රයක් භාරදීමෙන් පසු අලුත් කරනු ලැබිය හැකි අතර වසරක කාලසීමාවක් සඳහා වලංගු විය යුතු ය."

(3) එහි 5 වන නියෝගයට පසුව ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් නියෝගය එකතු කිරීමෙන්:

"5අ. බලපත්‍රය නිකුත් කළ දින සිට මාස දොළහකට පසුව බලපත්‍රය අලුත් කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම්පත්‍රයක් ම එක් එක් ප්‍රමාද වසරක් සඳහා වාර්ෂිකව රුපියල් දස දහසක ගාස්තුවක් සමග ඉදිරිපත් කළ යුතු ය."

EOG 08 -0117

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.